Ch.

See
[handwritten initials] 1/12/94


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
# இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு வர்த்தமானப் பத்திரிகை
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka

අති විශෙෂ  அதிவிசேஷமானது  EXTRAORDINARY

අංක 796/6 – 1993 දෙසැම්බර් 08 වැනි බදාදා – 1993.12.08

796/6 ஆம் இலக்கம் — 1993 ஆம் ஆண்டு திசெம்பர் மாதம் 08 ஆம் திகதி புதன்கிழமை

No. 796/6 – WEDNESDAY, DECEMBER 08, 1993

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)  (அரசாங்கத்தின் அதிகாரத்துடன் பிரசுரிக்கப்பட்டது)  (Published by Authority)


## I වැනි කොටස : (I) වැනි ජේදය – සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

ඇල්. ඩී. – බී. 21/78 III.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වැනි වගන්තිය සමග කියවිය යුතු 140 වැනි වගන්තිය යටතේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

1993 දෙසැම්බර් මස 01 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධිත) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයෙහි එය ක්‍රියාත්මක විය යුතුය.

2. 1993 පෙබරවාරි මස 15 වැනි දින අංක 755/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන (සංශෝධිත) නියමාවලිය මගින් අවසන්වරට සංශෝධිත, 1980 අප්‍රේල් මස 10 වැනි දින අංක 83/7 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1980 අංක 01 දරන වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :–

(1) එහි 13 වැනි ජේදයේ " ජ " අනුජේදයේ අගට පහත දැක්වෙන අනුජේදය එකතු කිරීමෙන් :–

" (ට) වෛද්‍ය පරිපාලනය "

(2) එහි 14 වැනි ජේදයේ –

(අ) (1) වැනි අනුජේදයේ (ඉ) අතුරු අනුජේදය අගට පහත දැක්වෙන අළුත් අතුරු අනුජේදය එකතු කිරීමෙන් :–

" (ඊ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල එක් එක් වෛද්‍ය සහ දන්ත වෛද්‍ය පීඨ මණ්ඩලවලට මේ අනුජේදයේ (ඇ) සහ (ඉ) අතුරු අනුජේද යටතේ සාමාජිකයකු තෝරා පත්කර ගැනීමට නොහැකි වන අවස්ථාවක, ඒ පීඨ මණ්ඩල විසින් ආරෝග්‍යශාලා උපදේශක කාර්ය මණ්ඩලයේ අර්ධ කාලීන ආචාර්යවරයන් අතුරින් සාමාජිකයකු තෝරා පත්කර ගනු ලැබිය හැකිය. "

(ආ) (2) වැනි අනුජේදයේ (ඇ) අතුරු අනුජේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අළුත් අතුරු අනුජේදය ඇතුළත් කිරීමෙන් :–

" (ඇඇ) පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල එක් එක් වෛද්‍ය සහ දන්ත වෛද්‍ය පීඨවල පීඨ මණ්ඩලවලට මේ අනුජේදයේ (ඇ) සහ (ඇ) අතුරු අනුජේද යටතේ සාමාජිකයකු තෝරා පත්කර ගැනීමට නොහැකි වන අවස්ථාවක, ඒ පීඨ මණ්ඩල විසින් ආරෝග්‍යශාලා උපදේශක කාර්ය මණ්ඩලයේ අර්ධ කාලීන ආචාර්යවරයන් අතුරින් සාමාජිකයකු තෝරා පත්කර ගනු ලැබිය හැකිය. "

(3) එහි 25 වැනි ජේදයේ " වෛද්‍ය විශේෂඥ ක්ෂේත්‍රය " යන්නෙහි අර්ථකථනයේ " දන්ත ශල්‍යය සහ සෞඛ්‍ය විද්‍යාව " යන වචන වෙනුවට " දන්ත ශල්‍යය, වෛද්‍ය පරිපාලනය සහ සෞඛ්‍ය විද්‍යාව " යන වචන ඇතුළත් කිරීමෙන්.